14 වන පිටෙන්

කක්කුස්සියට යන්න එපා. යන්න වෙන තැනකට. ගිහින් මෙන්න මේ විදියට වාඩි වෙන්න.” ඔහු උක්කුටිකයෙන් වාඩිවෙන ආකාරය අභිනයෙන් පෙන්වයි. වමතින් තමාගේ නාසය ද වසා ගනියි. පිරිස ඉතා උනන්දුවෙන් සිනාසෙමින් බලා සිටිති.

“වෙනද වගේ තටමන්න එපා. මහන්සි ගන්න එපා. ගානට කතා කරගෙන එයි. බිරූස්- බටි-බටි-බටි කියල. නැගිටින්න. හැරිලා බලන්න. මොනවද බලන්නේ. ඒකේ මැණික් තියෙනවා කියලද? ඒකේ රත්තරන් තියෙනව කියලද? හැබැයි දුන් දාන හැටිත් බලන්න. හොඳට නහය වහගන්න. නැත්නම් දුවන්න වෙයි අල්ලපු ගමට. දැන් බලන්න මොන තරම් සනීපයක්ද කියලා. දිව්‍ය ලෝකෙ ගියා වගේ නෙමෙයිද කියල. දැන් හිතන්න තමන් නි-රෝගී පුද්ගලයෙක් කියලා. වාසනාවන්ත පුද්ගලයෙක් කියලා. බඩේ කිසි කුණු ජරාව නැති හොඳ දිව්‍ය ඖෂධයක් බඩේ තියෙන වාසනාවන්ත මිනිහෙක් කියලා. හෙට රෑටත් එකක් බොන්න. ආයිත් අනිද්දා රෑටත් එකක් බොන්න. මුළු ජීවිතේට ම පෙති තුනයි. නරකද පෙති තුනකින් තමාගේ ජීවිතය ලෙඩක් නැති, අසනීපයක් නැති, රෝගයක් නැති කාය ශක්තිය බලය උතුරන ජීවිතයක් වෙන එක.’’

‘‘ඔය හතර දෙනාට විතරක් මම නොමිලයේ තව එක පෙත්ත ගානේ දෙනවා. එක පෙත්තකට නම් චූටි සත පනහක් වියදම් කරන්න වෙනවා. අනිත් ඔක්කොටම පෙති තුන ම රුපියලකට දෙනවා. චූටි රුපියලකට. රුපියලකට නිරෝගී වාසනාවන්ත පුද්ගලයෙක් වෙන්න අකැමති කවුද? අකමැති එහෙම අය මෙහෙ ඉන්නවා නම් යන්න අංගොඩ. අපරාදෙ කාලෙ කන්නෙ නැතුව. ගිහින් තියෙන වැඩක් බලාගෙන හැමදාම ලෙඩෙක් වෙලා ඉන්න. කැමති අය පමණක් අත දික් කරන්න. පොර කන්න එපා. මා ළඟ තියෙන්නේ තව ටික දෙනෙකුට විතරයි. බඩු ඉවරයි ගෙන්නපුවා. ලබන බදාදාට අනිත් කොටස මට එවනවා. ලබන ඉරිදට දෙන්නම්. ඒ වන තෙක් ඉවසන්න. අනේ තරහ වෙන්න එපා. පළමුව ජය ලබන වාසනාවන්ත අය මට රුපියල ගානේ දෙන්න. ආ මෙන්න ගන්න.’’

මෙසේ පවසා ඔහු බොහෝ දෙනෙකුට පෙති අලෙවි කරයි. ඒ කාලයේ හැටියට රුපියල් පනහකට වැඩි ප්‍රමාණයක් ඔහු එකතු කර ගනියි. බෑග් එක වසා ‘‘අනිත් අය ලබන ඉරිදට මෙතෙන්ට ම එන්න. මං ඉන්නවා. දැන් ඔන්න ගම්ලත් ගියා. ආයිබෝන්. ටටා. චෙරියෝ. අස්ලාම් ආලේකුම්, ශ්‍රී ලංකා මාතා’’ කියමින් ඔහු නැගිට බෑගයත් ඔසවාගෙන ඉවත් වී යයි. මෙවන් වූ නොයෙකුත් ආකාරයේ වෙළෙන්දෝ ඉරිදා පොළ රසවත් කරන අතර ඔවුන්ගේ ජීවන වෘත්තිය මනාව කරගෙන යති.

කවිකොළ විකුණන කීප දෙනෙක් සිටිති. ඔවුහු කවි කොළයේ කවි ඉතා ලස්සනට ඇදපැද ගායනා කරමින් පොළ පුරා ඇවිදිති. එම කාල වකවානුවට අනුව කිසියම් සිද්ධියක් මුල් කරගෙන කවි කොළය සකස් වී ඇත.

සකල සිරින් පිරි සිරි ලංකාවේ
වයඹ පළාතේ අති සොබනා
පතළ ගමක් ඇත මංගල එළියයි
බත බුලතින් කිසි අඩු නොවනා
කොමළ යසට හැඩ අඟනක් උන්නා
විමලාවතී යන නම දරනා
කපල කොටල ඈ මරලා දාලලු
අනේ පුවත දෙම් කවි බසිනා

එවන් විශේෂිත කරුණක් නොමැති නම් කාලගෝල කථාව, වෙස්සන්තර ජාතකය, වැනි ජාතක කථා මුද්‍රණය කැරුණු “පිටු අටේ පෝරමේ ” පුංචි කවි පොත් විකුණති.

“මහා සීතාරාම ගුලිය” විකුණන සරම සහ කෝට් එක ඇඳ කොණ්ඩය බැඳ ඇති සීතාරාම වෙදමහත්තයා මහා හයියෙන් කෑ ගසමින් පොළ පුරාම ඇවිදිමින් “සීතාරාම ගුලි” විකුණයි.

සමහර දිනක සයිකල් රේස් පෙන්වන තාත්තා, අම්මා සහ දරුවෝ ය. තනි රෝදයේ සයිකලයෙන් පඩිපෙළවල් පවා නැග සෑම තැනකට ම ගොස් මුදල් ලබා ගැනීමට උනන්දු වෙයි. දකුණතේ ඇඟිලි දෙකක් කටට තබා විසිල් කර ජන අවධානය ලබාගන තමාගේ හපන්කම් පෙන්වයි.

තවත් තැනක ‘‘පිචර්’’ පෙන්වන පෙට්ටියකි. එම පෙට්ටියෙහි දෑස තබා ගැනීමට සිදුරු දෙකක් ඇත. නරඹන්නාගේ උසේ තරමට උස් පහත් කිරීමට හැකි රඳවනයක් මත මෙය තබා ඇත. පෙට්ටියෙන් එල්ලා වැටෙන නූලක් වරින්වර පහළට අදිමින් වෙනස්වෙනස් පින්තූර පෙන්-වන්නේ කවි කියමිනි. පින්තූරයට අදාල කවිය අනුව රූප පෙට්ටිය තුළින් පින්තූර පෙනෙයි. දඹදිව සිද්ධස්ථාන, ලංකාවේ සිද්ධස්ථාන ආදී දේ මේ අනුසාරයෙන් පෙන්වයි. එක වරකට නැරඹිය හැක්කේ එක් අයකුට පමණි. මේ සඳහා එක් අයකුගෙන් අය කරන්නේ සත පහකි.
උසටඋසේ සිටින බොරු කකුල් කාරයෙකි. ඔහු ඉතා හොඳින් සැරසී සිටියි. ‘‘රාජා බීඩි ස්පෙෂල්’’ යනුවෙන් ගැසූ බෝඩ් දෙකක්, ඉදිරියෙන් සහ පිටු පසින් කරේ එල්ලා ගෙන ඇත. ඔහු අත ඇති පෙට්ටියකින් එකට අමුණන ලද බීඩි දෙක බැගින් බිම සිටින අයට විසි කරයි. බිම සිටින අය පොර කමින් ඒවා අහුලා ගනිති. ඒ බීඩි පිළිබඳව ප්‍රචාරක මාධ්‍යයකි.

ඉරිදාට මෙම පොළෙහි කඩල වෙළඳාමක් මම ද ඇරඹුවෙමි. අම්මා තම්බා දෙන කඩල බේසම, පොළ පුරාම ඇවිදිමින් ‘‘කඩලේ කඩලේ’’ යනුවෙන් කෑ ගසමින් කඩල විකුණුවෙමි. කඩල ගොටුවක් සත පහකි. කඩදාසියකින් ගොටුවක් ගසා එයට ලොකු පිත්තල හැන්දෙන් හැඳි දෙකක් දමා තව ඩිංගක් ද දමා දීමට මම පුරුදු වී සිටියෙමි. සෙනසුරාදා හවසට අතුරේ අමරසේන මහතාගේ කඩයෙන් කඩල රාත්තල් දෙකක් මිල දී ගෙන යන්නේ මා ය. එයට වියදම රාත්තලක් සත තිහ බැගින් සත හැටකි. අම්මා ඉරිදා පාන්දරට එය තම්බා තෙම්පරාදු කොට පොල් කෑලි කපා මිරිස් බැද දමා කලවම් කර බේසම මගේ ඔළුව උඩින් තබන්නේ ‘‘දෙවියන්ගේ පිහිටෙන් ඔක්කොම විකිණෙන්න ඕනෙ’’ කියමිනි. මා සරම ඇඳ ඉණ පටියක් බැඳ, උරහිසින් පටි ගැට ගසන වර්ගයේ බැනියමක් ද ඇඳ අතුර පොළට යන්නේ පයින් ම ය. සවස්වන විට කඩල සේරම ඉවර කර ගන්නා අතර ඉරිදාට සත පනහක් හැටක් එයින් උපයා ගනිමින් එම මුදල් මාගේ පොත් පැන්සල් ආදිය මිල දී ගැනීමට යොදා ගනිමි.

මගේ පොළේ වෙළදාම කඩලවලට පමණක් සීමා වූයේ නැත. දෙසැම්බර් මාසයේදී “ඈපා ලිත” පොළේ විකිණීමේ කාර්යය මට පැවරුවේ අමර-සේන මහතාගේ කඩයේ කළමනාකරු ලෙස කටයුතු කළ “පීටර් අයියා” ය. ඈපා ලිතේ මිල සත පහළොවකි. එක ලිතකට මට සත දෙකක කොමිස් මුදලක් ලැබෙයි. ඉරිදා දිනට එම කාල වකවානුව අනුව ලිත් තිහක් හතලිහක් විකිණීමට හැකි ය. දෙසැම්බර් අන්තිම සතියේ ඉරිදා සහ ජනවාරි මාසේ මුල් සතියේ ඉරිදා “ඈපා ලිත” පනහකට වැඩි ප්‍රමාණයක් විකුණා ගත හැකි ය. මගේ අතට ද රුපියලකට වඩා වැඩි ප්‍රමාණයක් ලැබේ. සිංහල අවුරුදු සුමානයේ ද ඈපා ලිත විකිණීමට පුළුවන. ඒ අවුරුදු නැකැත් බලා ගැනීම සඳහා ගෙන යන බැවිනි.
මෙම වකවානුවේ බණ්ඩාරනායක ඝාතනය සිදුවිණි. 1959 සැප්තැම්බර් මස 26 දින එවකට අගමැති ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා චීවර ධාරියකුගේ වෙඩි පහරින් මරණයට පත්වූ පුවත රටේ මහත් ආන්දෝලනයට තුඩු දුන්නකි.

බණ්ඩාරනායක මැතිතුමාගේ පින්තූර අලෙවි කිරීමේ කාර්යය මට පැවරුවේ ද අමරසේන මහතාගේ කඩයෙනි. සත දහයකට විකුණන බණ්ඩාරනායක මැතිතුමාගේ සිය පවුල සිටින පින්තූරයකින් මට සත දෙකක් ලැබේ. ඝාතනයට අදාළ පින්තූර කිහිපයක් සහිත කොළය සත විසි-පහකි. එය සෝමාරාම හිමිගේ පින්තූරයක්, බණ්ඩාරනායක මහතාගේ පින්තූරයක්, සිය පවුලේ පින්තූරයක්, වෙඩි තැබූ පිස්තෝලයේ පින්තූරයක් ආදී පින්තූර කීපයකින් යුතුව ’’ආර්ට් පේපර්” කඩදාසියෙන් මුද්‍රණය කරන ලද්දකි. එවකට වෛවර්ණ මුද්‍රණ තිබුණේ ම නැත. එම පින්තූර මුද්‍රණය කොට තිබුණේ දුඹුරු පැහැයෙනි.
ඈපා ලිත සහ බණ්ඩාරනායක ඝාතන පින්තූර අලෙවිය නිමවීමත් සමඟ පොළේ ඇවිද වෙළදාම සඳහා අමරසේන මහතාගේ කඩයෙන් “ආය කටු, කොණ්ඩ කටු, ආදිය දුන්ණත් ඒවා අලෙවියෙන් ලැබෙන මුදල මදි ය. එක කැරැල්ලක් විකිණීමෙන් කොමිස් ලැබෙන්නේ සතයකි. සමහර දිනට කටු කැරලි විසිපහක්වත් විකුණා ගැනීමට නොහැකි ය.

එම නිසා වෙනත් ආකාරයක් ගැන කල්පනා කොට පොළේ මුදලාලිලා කීප දෙනෙකුගෙන් ම බඩු වික-ිණීම සඳහා උදව් වීමට එන්නදැයි අසා, අවසා-නයේ දෙනිකඩේ මුදලාලිගේ කරවල සිල්ලර වෙළදාමට ගෝලයෙක් හැටියට වැඩ කළෙමි. රවුම් ඇලුමිනියම් බාස්කට් එකකට අම්මා බෙදා දෙන බත් එක රැගෙන පොළට පැමිණ දෙනිකඩේ මුදලාලිගේ වෙළඳ කෑල්ලෙහි බඩු විකුණමි. මිරිස්, ලූණු, අල සහ කරවල වර්ග කිහිපයක් ඇත. “ලාබයි ලාබයි ලාබයි” කියමින් කෑ ගසමින් වෙළදාම කෙරුවෙමි. ගෙදරින් බත් ගෙන ඒමට නොහැකි වුණු දවසට තෝසේ කඩයෙන් තෝස දෙකක් කා ප්ලේන්ටියක් බී එදා වේල පිරිමසා ගනිමි. ඒ සඳහා වැය වන්නේ සත පහළොහකි. හවසට මුදලාලි සත පනහක කුලියක් මට දෙයි. එය රැගෙන මම ගෙදර යන්නේ ඉතිරි බඩු ගෝණි ගැට ගසා කරත්තයට ද පැටවීමෙන් පසුව ය.

ද්‍රවිඩ පාරිභෝගික පිරිසට බඩු විකිණීම සඳහා අවශ්‍ය වචන ස්වල්පයක් ද, මුදල්වල ගණන් ටික ද මට ඉබේට ම පුරුදු වූයේ ඇසෙන ශබ්දයට අනුව ය. එන්න වේනු (මොනවද ඕනේ - එන්න වේනුම්) තෙලෙන්ග(අල-කිළංගු) වේන්ගායම්(ලූනු) පෙරිය වේන්ගායම්(රටලූනු) කොච්චික්කායි (මිරිස්) ඔන්රු, ඉරන්ඩු, මූන්රු, නාලු (නාංගු), අංජි (ඓන්දු), ආරු, ඒලු, එට්ටු, ඔන්බදු, පත්තු (එක, දෙක, තුන, හතර, පහ, හය, හත, අට, නවය, දහය) ආදී වශයෙන් ඉලක්කම් ටික කීමට ද මට පුරුදු විය. ඉරුපදු, මු-ප්පදු, නාට්පදු, ඉරුවත්අන්ජි (ඉරුවත්තෛන්දු), මුප්පත්අන්ජි (මුප්පත්තෛන්දු) ආදී වශයෙන් දෙමළ වචන රාශියක් මට යන්තම් හුරුව පැවතිණි. ඒ තරම මට ප්‍රමාණවත් ය.

සතියට පාසල් අඳින සරම සහ කමිසය සෙනසුරාදාට සෝදා ඉරිදා පොළට ඇඳ යළි ඊළඟ සතිය පාසලට අඳිමි. ඉරිදාට පොළේ කරවල විකුණන නිසා සඳුදාට කරවල සුවඳ ඇඳුම්වලින් විසිරෙයි.

එම කරවල කඩයෙන් මට සතියට ලැබෙන්නේ සත පණහක් පමණක් බැවින් එය මගේ හිතට මදි ය. වෙනත් තැන්වල වැඩ කරන ළමයින්ට රුපියල් දෙකක් දෙන බව ඔවුන් කියා ඇත. ඒ ඇත්ත ද බොරු ද නොදනිමි. එහෙත් රුපියලකට වඩා ලැබෙන බව මට විශ්වාස ය. අලුතෙන් පොළට පැමිණි වෙනත් මුදලාලි කෙනෙකු ළඟට ගොස් ‘‘බඩු විකුණන්න මමත් එන්නද’’ යනුවෙන් ඇසුවේ ලැබෙන මුදල වැඩි කර ගැනීමට ය. ඔහු සත හැත්තෑපහක් දීමට පොරොන්දු වූ නිසා ඊළඟ සුමානයේ එතන බඩු විකිණීමට උදව් කළෙමි. එහෙත් එම කඩය සති දෙකකට වඩා තිබුණේ නැත. යළිත් පරණ මුදලාලි ළඟට ම පැමිණෙනවාට වඩා වෙන විකල්පයක් තිබුණේ නැත. “අපි දන්නවා ආපහු එන එක. වරෙන් මෝඩයො. මීට පස්සෙ හෙම ගියොත් නම් ආපහු ගන්නෙ හෙම නෑ.’’ දෙනිකඩේ මුදලාලි කීවේය.

**කැරවෑන් කර්මාන්තයේ දක්ෂයෙක් අවශ්‍යයි.**

කැරවෑන් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාමට මනා දැනුමක් ඇති කැරවෑන් වර්ග, සැලසුම්, වැසි ඇතුළු කැරවෑන් නිපදවීමේ සියලුම දේ ගැන ඉහල පලපුරුද්දක් ඇති කෙනෙකු අවශ්‍යයි.

කරුණාකර අමතන්න චාමර 0490104398




**LAND FOR SALE**
**BATTARAMULLA**
SUBUTHIPURA - ROHANA MAWATHA

**9 Perches**

Contact
**Liyanage 0468 685 464**